**කොටපොල ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 05 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කොටපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ වැඩිපුර ඇස්තමේන්තුගත කළ රු.770,725 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට ගැලපීම් නොකර, අවිනිශ්චිත ගිණුමට බැර කර තිබුණි.

(ආ) අයකරගෙන තිබුණු රු.255,674 ක් වූ නිශ්චිත ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය නොකර අවිනිශ්චිත ගිණුම මගින් ලියාහැර තිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂය සඳහා ලැබුණු රු.4,000,000 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම් සමාන අගයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) සභාවට අයත් ගොඩනැගිලි 13 ක හා ඉඩම් 02 ක වටිනාකම් සහ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.99,850 ක් වූ ජල උපකරණ තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, ජල ගාස්තු තොග ගිණුමේ ශේෂය රු.116,175 ක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත ගිණුමෙන් පොදු ගිණුමට මාරු කරන ලද රු.1,524,000 ක වටිනාකම ණයහිමි ගිණුමට හර කිරීම නිසා ණයහිමි ශේෂය සමාන අගයෙන් අඩුවෙන් දැක්වුණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම

---------------------

එකතුව රු.1,460,873 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂයට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට කටයුතු නොකර විවිධ ගිණුම්වලට ලියා හැරීම මඟින් අවිනිශ්චිත ගිණුම පියවා තිබුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.70,078,685 ක් වූ ලැබියයුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.1,331,796 ක ශේෂ 74 ක්ද, එකතුව රු.71,461,313 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ රු.35,212,286 ක ශේෂ 92 ක් ඇතුළත් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එකතුව රු.104,562,609 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත්ව පන්ති අනුව පිළියෙළ කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ ඉඩම් පිළිබඳ හිමිකම් ඔප්පුද, රු.2,535,552 ක් වූ තැන්පතු ශේෂ 14 ක් පිළිබඳ උපලේඛන හා කාල විශ්ලේෂණද ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 ප්‍රකාර අයවැයගත හා පරිපූරක වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් හා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ගිණුම් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,854,361 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,439,133 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,584,772 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

(අ) ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් මුළු පුනරාවර්තන ආදායමින් සියයට 94 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| වර්ෂය | මුළු පුනරාවර්තන ආදායම් | ආදායම් ආධාර | ස්වයං උත්පාදිත ආදායම් | මුළු පුනරාවර්තන වියදම් | ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 46,896,438 | 25,245,266 | 21,651,172 | 44,042,077 | (22,390,905) |
| 2014 | 38,812,421 | 16,453,104 | 22,359,317 | 34,373,288 | (12,013,971) |
| 2013 | 32,199,000 | 11,596,580 | 20,602,420 | 26,602,163 | (5,999,743) |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය ඇතුළුව ඉකුත් වර්ෂ දෙකෙහි ආදායම් ආධාර වල වර්ධනයක් පෙන්නුම් කළද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ස්වයං උත්පාදන ආදායමේ අඩුවීමක් දක්නට ලැබුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වර්ධනය වී ඇති නමුත්, එම තත්ත්වය පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම මෙන් දෙගුණයක් ඉක්ම වූ අගයකින් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණි.

(iv) ආදායම් ආධාර නොලැබෙන්නට ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාව නොලැබෙන තත්ත්වයක් පෙන්නුම් කරනු ලැබේ.

(v) ඉහත අංක (i) සිට (iv) දක්වා ඡේදවල දැක්වෙන කරුණු අනුව ආදායම් ඉහළ නංවා ගැනීමට මෙන්ම වියදම් පාලනය කර ගැනීමට සභාවේ අවධානය යොමුවිය යුතුව ඇති බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ පවතින දුර්වල මූල්‍ය කළමනාකරණය හේතුවෙන් ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වියහැකි බවත්, සභාවේ අඛණ්ඩ පැවැත්මට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවත් නිරීක්ෂණය විය.

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කාරක ප්‍රාග්ධනය රු.7,081,537 කින් වර්ධනය වී තිබුණි. නමුත් ණයගැති ශේෂය තුළ වසර 3 ක කාලයක් ඉක්මවා අයනොවී පවතින රු.45,083,975 ක ශේෂ ඇතුළත් වී තිබීමෙන් කාරක ප්‍රාග්ධනය මගින් දැක්වෙන ආකාරයට ද්‍රවශීලතා තත්ත්වයක් නොපැවතින.

**2.4 ආදායම් පරිපාලනය**

**2.4.1 වරිපනම් බදු**

සමාලෝචිත වර්ෂයේ රු.264,234 ක් වූ ආරම්භක හිඟ ශේෂය සහ බිල්කිරීම් සමඟ රු.431,356 ක් අය විය යුතුව තිබුණි. ආරම්භක හිඟයෙන් සියයට 45 ක් හා බිල් කිරීම් වලින් සියයට 73 ක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු නොකිරීම හේතුවෙන් සෑම වර්ෂයකම හිඟ ශේෂය ඉහළ අගයක් ගෙන තිබුණි.

**2.4.2 අක්කර බදු**

සමාලෝචිත වර්ෂයේ රු.320,694 ක් වූ ආරම්භක හිඟ ශේෂය සහ බිල්කිරීම් සමඟ රු.360,505 ක් අයවිය යුතුව තිබුණි. ආරම්භක හිඟ ශේෂයෙන් සියයට 29 ක් සහ බිල්කිරීම් වලින් සියයට 61 ක් අයවී තිබුණි. දිගින් දිගටම පවතින හිඟ මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

**2.4.3 පොළ මාළු ලැලි බදු**

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය රු.97,255 ක් වූ අතර, එම අගයෙන් කිසිදු මුදලක් වර්ෂය තුළදී අයවී නොතිබුණි. හිඟ බදු මුදල් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**2.4.4 ජල ගාස්තු**

එකතුව රු.1,262,303 ක් වූ ආරම්භක හිඟ ශේෂය සහ රු.2,780,474 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.4,042,777 ක් අයවිය යුතුව තිබුණි. ආරම්භක හිඟයෙන් සියයට 87 ක් හා වර්ෂයේ බිල් කිරීම් වලින් සියයට 57 ක් අයවීම නිසා වර්ෂය අවසානයට සැලකියයුතු හිඟ ශේෂයන් පැවැතුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට එරෙහිව පවරන ලද නඩු

සභාවට එරෙහිව මාතර දිසා අධිකරණයේ පවරන ලද නඩුවක් සමථයට පත්වී වර්ෂ 03 ක කාලයක් ගතවී තිබුණු නමුත්, නඩුව වෙනුවෙන් තැන්පත් කර ඇති රු.40,000 ක ඇප මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මානව සම්පත් කළමනාකරණය

ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 12 දෙනෙකු බඳවාගෙන තිබුණු නමුත්, එම අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමට සහ ද්විතියික මට්ටමේ පැවැති පුරප්පාඩු 03 ක් පිරවීමට පියවර ගෙන නොතිබුණි.

**3.2 හඳුනාගත් අලාභ**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1996 මැයි සිට 2005 වසරේ ජූලි දක්වා කාලපරිච්ඡේදය සඳහා තුසිත සිනමා ශාලාවෙන් හිඟව පවතින රු.419,132 ක් වූ මුදල අයකර ගැනීම සඳහා මාතර දිසා අධිකරණයේ පවරන ලද නඩුවට සභාවෙන් කිසිදු නිලධාරියෙකු සහභාගි නොවීම හේතුවෙන් නඩුව ප්‍රතික්ෂේප කර තිබුණි. එම හේතුව නිසා හිඟ මුදල අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් පවතින බවත් එය සභා අරමුදලට වූ පාඩුවක් ලෙස නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) පළාත් පාලන කොමසාරිස් විසින් දේපල ණය වලට අදාළ පොලී නිසි පරිදි නිරවුල් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු පොලීවල එකතුව රු.205,423 ක් විය.

(ඇ) සභාව විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු මුදල් නියමිත පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් රු.35,051 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

## 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සභා බල ප්‍රදේශයේ පවත්න කර්මාන්ත ශාලා 20 න් එක් කර්මාන්ත ශාලාවක අපද්‍රව්‍ය පමණක් සභාව මඟින් බැහැර කරන බව නිරීක්ෂණය වූ අතර, අනෙක් කර්මාන්ත ශාලාවල අපද්‍රව්‍ය බැහැර කරන ක්‍රමවේදය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය ප්‍රකාර කාර්ය සාධනය අනුව වැය විෂයයක රු.2,322,000 ක් වූ මුළු ප්‍රතිපාදනයද, වැය විෂයයන් 07 ක ඉතිරි කිරීම්වල එකතුව රු.159,960,687 ක්ද, වියදම් විෂයයන් 02 ක සීමාවන් ඉක්මවා රු.5,611,034 ක වියදම්ද , ආදායම් විෂයයන් 03 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම රු.167,039,492 ක්ද වීමෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධාන සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, අභ්‍යන්තර විගණන නිලධාරියාට වැටුප් හා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.441,964 ක මුදලක් ගෙවා තිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

---------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

(i) 2009 වසරේදී දකුණු පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ව්‍යායාම් උපකරණ කට්ටලය පුහුණු උපදේශකයෙකු නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ii) සභාවට අයත් මිට්සුබිෂි කැබ් රථය 2014 පෙබරවාරි මස සිට නිෂ්ක්‍රීයව පවතින නමුත්, එය අලුත්වැඩියා කර ධාවනයට යොදවා ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන යටතේ සභාවට ලැබී තිබුණු සංගීත උපකරණ 53 ක් කිසිදු ප්‍රයෝජනයකට යොදවා නොගෙන නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

----------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි කළ යුතු බවට නිර්දේශිත රු.64,037 ක් වටිනා ලී තොගය 2016 අගෝස්තු වන විටත් වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය